| |
|---|
| සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்<br>Sabaragamuwa Provincial Department of Education |

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2018<br>இரண்டாம் தவணைப் பரீட்சை<br>2nd Term Test 2018 | 6 ශ්‍රේණිය<br>தரம் 6<br>Grade 6 |

| | | |
|---|---|---|
| ඉතිහාසය<br>வரலாறு<br>History | I<br>I<br>I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**විභාග අංකය ........................................................................................................................................**

---

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

---

**01.** ලංකාවේ මුල්ම සාහිත්‍යමය මූලාශ්‍රය වන්නේ,

**(1)** මහා වංශය. **(2)** දීප වංශය. **(3)** චූල වංශය. **(4)** දළදා වංශය.

**02.** ඉතිහාසය ඉගෙනීම තුලින් අපට ලද හැකි ප්‍රයෝජනයක් වන්නේ,

**(1)** අතීතය තුළින් අනාගතය ගොඩනගා ගැනීමය.

**(2)** අතීතය පිළිබඳ කතන්දර දැන ගැනීමය.

**(3)** පුරාවස්තු විකිණීමෙන් ආදායමක් ලබා ගැනීමය.

**(4)** පුරාවස්තු නැවත ගොඩ නැගීමය.

**03.** බුද්ධ වර්ෂ ක්‍රමය ආරම්භ වනුයේ,

**(1)** ක්‍රිස්තුස් වහන්සේගේ උපතේ සිටය.

**(2)** ක්‍රිස්තුස් වහන්සේගේ මරණයේ සිටය.

**(3)** සිද්ධාර්ථ කුමාර උත්පත්තියේ සිටය.

**(4)** සම්බුද්ධ පරිණිර්වානයේ සිටය.

**04.** දූවිලි වලාවක් හෙවත් 'නිහාරිකාවක්" හැඳින්වීමට යෙදෙන තවත් පදයකි.

**(1)** නෙබියුලාව **(2)** වෙනිසියුලාව **(3)** චක්‍රාවාටය **(4)** ආවාටය

**05.** "ඔපබීනියා" නමින් හැඳින්වූ මුහුදු පත්ලේ ජීවත් වූ සත්වයා පිළිබඳව තොරතුරු ලැබී ඇත්තේ,

**(1)** ඕස්ට්‍රේලියාවෙනි **(2)** ලංකාවෙනි **(3)** කැනඩාවෙනි **(4)** ඉන්දියාවෙනි

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ යොදන්න.**

**06.** ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තියට පෙර කාලය ක්‍රිස්තු වර්ෂ ලෙස හඳුන්වනු ලැබේ. ( )

**07.** ඈත අතීතයේ පැවති අධික ශීතල සහිත දේශගුණය "මහා හිම යුගය" යනුවෙන් හැඳින්වේ. ( )

**08.** මාලිමා යන්ත්‍රය මුලින්ම ලෝකයට හඳුන්වා දුන්නේ චීන ජාතිකයන් විසින්ය. ( )

**09.** පණ්ඩුකාභය රජතුමා කුඩා කාලයේ ජීවත්වූ ගම්මානය දොරමඩලාව වේ. ( )

**10.** හොලෝසීන යුගයේ මිනිසා ගොවිතැන ආරම්භ කළේය. ( )

- **අංක 11 සිට 15 දක්වා ඇති වගන්තිවල හිස්තැනට අදාල පිළිතුර පහත දි ඇති වචන අතුරින් තෝරා ලියන්න.**

***(හමුරාබි, ගීසා, ඉන්දුනිම්න, හෝමෝසේපියන්ස්, පණ්ඩුල)***

**11.** මෙහෙන්දජාරෝ නගරය .......................................................... ශිෂ්ටාචාරයට අයත්වේ.

**12.** නූතන මානවයා හඳුන්වනු ලබන්නේ ........................................ නමිනි.

**13.** ලෝකයේ පැරණිතම නීති පොත සකස් කර ඇත්තේ .............................................. නම් පාලකයා විසිනි.

**14.** පණ්ඩුකාභය කුමරා අධ්‍යාපනය ලැබුවේ ............................................ බමුණා වෙතිනි.

**15.** ඊජිප්තු වැසියන් ඉදිකළ විශාලතම පිරමීඩය .......................................... නම් ස්ථානයේ දක්නට ලැබේ.

- **අංක 16 සිට අංක 20 දක්වා ප්‍රශ්නයන්හි (අ) කොටසට ගැලපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

| "අ" | "ආ" |
|---|---|
| **16.** මහානාම හිමියන් විසින් රචිත වංශ කථාව - .............................................. | **A.** සිරිසවත්ථුව |
| **17.** මැටි දැකැත්ත නිපදවීම - .............................................. | **B.** නව ශිලා යුගය |
| **18.** ඊජිප්තු වැසියන් ලේඛන කටයුතු සඳහා යොදා ගත්තේ .............................................. | **C.** ථූපාරාමය |
| **19.** ශ්‍රී ලංකාවේ වාසය කළ යක්ෂ ගෝත්‍රිකයන් පාලනය කළ නගරයකි. .............................................. | **D.** මහා වංශය |
| **20.** ශ්‍රී ලංකාවේ ඉදිකළ ප්‍රථම ස්ථූපය .............................................. | **E.** පැපිරස් පත්‍ර |

**(ලකුණු 20 × 2 = 40)**

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018 | 6 ශ්‍රේණිය
இரண்டாம் தவணைப் பரீட்சை | தரம் 6
2nd Term Test 2018 | Grade 6

ඉතිහාසය II
வரலாறு II
History II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය ..........................................................................................................................................

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

**01. (අ)** ඔබට සපයා ඇති ලෝක සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

**1.** සින්දු ගඟ **2.** මෙසපොතේමියාව

**3.** ඊජිප්තුව **4.** ඉන්දියන් සාගරය (ලකුණු $4 \times 2 = 8$)

- **පහත දී ඇති පින්තූර අධ්‍යනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**(ආ)**



**(i)** මෙහි දැක්වෙන නිර්මාණය කුමක්ද?

**(ii)** එම නිර්මාණය හමුවී ඇත්තේ කුමන ශිෂ්ටාචාරයෙන්ද?

**(iii)** මෙම රූපයෙහි දැක්වෙන සත්වයා නම් කරන්න. (ලකුණු $3 \times 2 = 6$)

**(ඇ)**



**(i)** මෙහි දැක්වෙන ස්තූපය කුමක්ද?

**(ii)** එම ස්තූපය නිර්මාණය කරවූයේ කවුරුන් විසින්ද?

**(iii)** මෙම ස්තූපය පිහිටා ඇති නගරය නම් කරන්න. (ලකුණු $3 \times 2 = 6$)

**02. (i)** වරහන තුළ දී ඇති වචන අතුරින් සාහිත්‍ය මූලාශ්‍රයක් හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් තෝරා ලියන්න.
(මහවැලි ගඟ, පොළොන්නරුව ගල් විහාරය, මහා වංශය, දැදුරු ඔය) (ලකුණු 2)

**(ii)** කාලය මැනීමට යොදාගත් වර්ෂ ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 3)

**(iii)** ඉතිහාසය ඉගනීමේ ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 5)

**03. (i)** මිනිසා වෙනත් සතුන්ගෙන් වෙනස් වන සාධක දෙකක් ලියන්න. (ලකුණු 2)

**(ii)** මිනිසාගේ සංස්කෘතික දියුණුවේ ප්‍රධාන අවධි තුන නම් කරන්න. (ලකුණු 3)

**(iii)** නව ශිලා යුගයේ දී මානව ජීවිතයේ ඇති වූ වෙනස්කම් පහක් ලියන්න. (ලකුණු 5)

**04. (i)** පහත සඳහන් බෝග වර්ග මුල්වරට වගා කළ රටවල් නම් කරන්න. (ලකුණු 2)

**(අ)** වී වගාව

**(ආ)** තිරිඟු වගාව

**(ii)** මුහුණේ ස්වරූපය අනුව මිනිසා බෙදනු ලබන වර්ග තුනක් ලියන්න. (ලකුණු 3)

**(iii)** ශිෂ්ඨාචාරය බිහිවන සමයේ ගම හා නගරය අතර දක්නට තිබූ වෙනස්කම් පහක් ලියන්න. (ලකුණු 5)

**05. (i)** ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර දෙකක් ලියන්න. (ලකුණු 2)

**(ii)** මෙසපොතේමියානු සමාජය බෙදී තිබූ කොටස් තුනක් නම් කරන්න. (ලකුණු 3)

**(iii)** ඊජිප්තු ශිෂ්ටාචාරය පිළිබඳ වගන්ති පහක් ලියන්න. (ලකුණු 5)

**06. (i)** ආදී මානවයා සිය ශරීරය අලංකාර කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රම දෙකක් ලියන්න.
(ලකුණු 2)

**(ii)** ආදී මානවයා අනුගමනය කළ අවමංගල චාරිත්‍ර තුනක් ලියන්න. (ලකුණු 3)

**(iii)** විජය කුමරු ඇතුළු පිරිස ශ්‍රී ලංකාවට පැමිණෙන සමයේ


**(අ)** එවකට ලංකාවේ විසූ ජන කොටස් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

**(ආ)** ආර්ය ජන කණ්ඩායම් පිහිට වූ ගම්මාන තුනක් නම් කරන්න. (ලකුණු 3)

**07. (i)** පණ්ඩුකාභය රජුගේ දෙමාපියන් නම් කරන්න. (ලකුණු 2)

**(ii)** පණ්ඩුකාභය රජතුමා අනුරපුර නගරය ක්‍රමවත් කිරීමට අනුගමනය කළ පියවර තුනක් ලියන්න.
(ලකුණු 3)

**(iii)** දේවානම්පියතිස්ස රජ සමයේ ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ධර්මදූත කණ්ඩායම නම් කරන්න. (ලකුණු 5)


යුරෝපය
මෙසපොතේමියාව
ඊජිප්තුව
ඉන්දියන් සාගරය